**පුත්තලම ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 11 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය**
**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට පුත්තලම ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) කඩ කුලී ලේඛනය අනුව, සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම රු.802,980 ක් වුවත්, එය රු.200,745 ක් වශයෙන් ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ කඩ කුලී ආදායම රු.602,235 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ලබාගෙන තිබූ ණය මුදලෙහි වාරික හා පොළී නිසි කාලයේ දී නොගෙවීම නිසා 2011 වර්ෂයේ දී සභාවට ලැබිය යුතු උසාවි දඩ මුදල් වලින් රු.1,277,505 ක් වයඹ ප්‍රධාන ලේකම් විසින් ඍජුවම දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත යවා තිබීම ගිණුම්ගත නොකිරීම නිසා දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය හා පොළී ශේෂයන් එම වටිනාකමින් වැඩියෙන් ද, 2011 වර්ෂයේ දී සභාවට ලැබිය යුතු උසාවි දඩ මුදල් එම වටිනාකමින් අඩුවෙන් ද, දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**
**--------------------------**

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් හයක එකතුව රු. 32,963,177 ක් වූ අතර, උපයෝගී ලේඛණ අනුව අදාල ශේෂයන්ගේ එකතුව රු. 35,736,583 ක් වූයෙන් රු. 2,773,406 ක නොසැසඳුන ශේෂයක් අනාවරණය විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 41,050,512 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,978,645 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,892,876 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ හා 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ විධිවිධානවලට පටහැනිව 2009 වර්ෂයේ තෙවන කාර්තුවේ සිට 2012 සිව්වන කාර්තුව දක්වා එකතු කළ අගය මත බදු වශයෙන් රැස්කල රු. 1,912,830 ක මුදලක් හා ජාතිය ගොඩනැගීමේ බදු වශයෙන් රැස්කල රු. 333,971 ක මුදලක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (අ) | වරිපනම් හා බදු | 3,225 | 1,141 | 2,801 |
| (ආ) | බදුකුලී, කඩකුලී | 976 | 5,723 | 2,848 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 6,975 | 4,059 | 203,908 |

### 2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 මැයි සිට දෙසැම්බර් දක්වා අයවිය යුතු උසාවි දඩ මුදල් හා 2013 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලසීමාවට අදාලව අයවිය යුතු මුද්දර ගාස්තු අය වී නොතිබුණි.

## 2.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

නියැදි පදනම මත සිදුකරන ලද විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි සභාව සතුව පැවති වටිනාකම රු.625,000 ක් වූ අංක 53-6135 දරන ඩබල් කැබ් රථය, රු.165,500 ක් වටිනා අංක එස්.එෆ් -9114 දරන අත් ට්‍රැක්ටරය, වටිනාකම රු.5,055 ක් වන පා පැදිය සහ රු.35,000 ක් වටිනා වතුර මෝටරය වසර 03 සිට වසර 05 දක්වා වූ කාලයක් තිස්සේ නිශ්කාර්යව පැවතුණි.

## 2.6 අවිධිමත් ගනුදෙනු

(අ) ප්‍රාදේශීය සභාවට අනුයුක්ත සෞඛ්‍ය කම්කරු සේවිකාවකට සේවයට වාර්තා කිරීමකින් තොරව වසර 04 ක් තිස්සේ රු.953,232 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ආ) නියැදි පදනම මත සිදුකරන ලද විගණන පරීක්ෂණයකින් අනාවරණය වී තිබූ පරිදි සති පොල බදු රැස්කල සභා සේවකයින් විසින් උප කුවිතාන්සි 108 කින් අයකර ගෙන සභාවට නොගෙවා සාවද්‍ය පරිහරණයට ලක් කර තිබූ මුදල රු.15,615ක් විය.

## 2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ සේවකයන් විසින් එකතු කර තිබූ සති පොල බදු මුදල් දින 155 ක් දක්වා ප්‍රමාද කර සභාව වෙත ගෙවා තිබුණි.

(ආ) සභාවේ සේවය කළ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් සභාව වෙත පනවා තිබූ අධිභාර වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,807 ක් ගෙවා තිබූ අතර, ඉදිරියේ දී ඒ වෙනුවෙන් තවත් රු.1,117,364 ක් ගෙවීමට නියමිතව තිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය ශේෂය රු.2,994,962 ක් වූ අතර, සේවය හැරගිය, ස්ථාන මාරුවී ගිය, මියගිය හා විශ්‍රාම ගිය සේවකයින් 14 දෙනෙකුගෙන් අයවීම් හිඟ හිට තිබූ සේවක ණය ශේෂය වූ රු.45,844 ක් වසර ගණනාවක සිට අයනොවී හිඟව පැවතුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) සේවක ණය පාලනය
(ඈ) වාහන පාලනය